# යෝගාචාර විඥානවාදී මහායාන බෞද්ධ ගුරුකුලයේ ඓතිහාසික ආරම්භය හා දාර්ශනික සංවර්ධනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කරපික්කඩ සෝභිත හිමි[1], මැදවච්චියේ සංඝානන්ද හිමි[2], රොටුඹ ධම්මසිරි හිමි[3]

## හැඳින්වීම

ක්‍රි.ව. 01 සියවසේ කණිෂ්ක රාජ්‍ය සමයේ කාශ්මීරයේ ජාලන්දර නම් ස්ථානයේ පාර්ශ්ව හා අශ්වඝෝෂ යන භික්ෂූන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ සිව්වෙනි ධර්ම සංගීතියෙන් අනතුරුව මහායාන බුදුසමය විධිමත් ආකාරයෙන් ආරම්භ වූ බව බොහෝ වියතුන්ගේ මතයයි. කෙසේ වෙතත්, මහායාන බුදුසමයේ ආරම්භක පසුබිම විමර්ශනය කිරීමේදී, ප්‍රතිසංස්කරණවාදී අදහස් පිළිගත් වජ්ජිපුත්තක භික්ෂූන්ගේ මහාසාංඝික නිකාය එහි මූලික පදනම ලෙස සැලකේ. මහායාන බුදුසමය ගොඩනැගීමට බලපාන ලද විවිධ සාධක බෞද්ධ මූලාශ්‍රය හා පසුකාලීන ශාස්ත්‍රීය අධ්‍යයන තුළ විස්තර කෙරෙන අතර, බෞද්ධ නිකායාන්තරික දාර්ශනික මතවාද, බ්‍රාහ්මණික හා හින්දු ආගමික සංකල්පයන්ගේ බලපෑම්, එසේම ග්‍රීක දාර්ශනික චින්තනයන් යන කරුණු එහි දී ප්‍රධාන වේ. මෙම දාර්ශනික සංවර්ධන ක්‍රියාවලියත් සමඟ මහායාන බුදුසමය තුළ විවිධ ගුරුකුල හා දාර්ශනික සම්ප්‍රදායන් බිහි වූ අතර, යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය එහි ප්‍රමුඛ දාර්ශනික ගුරුකුලයක් ලෙස සැලකේ. යෝගාචාර විඥානවාදයේ දාර්ශනික චින්තනය මහායාන බෞද්ධ දර්ශනයේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇති අතර, විඥානය මූලික සත්ත්ව අත්දැකීම්, ආලයවිඥානය, ත්‍රිඃස්වභාවවාදය සහ බෝධිසත්ව මාර්ගය වැනි සංකල්ප ඔස්සේ එය විශේෂ දාර්ශනික ප්‍රවණතාවක් ලෙස වර්ධනය වී ඇත. මෙම ශාස්ත්‍රීය පර්යේෂණය තුළින් යෝගාචාර විඥානවාද මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ඓතිහාසික ආරම්භය හා දාර්ශනික සංවර්ධනය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම අපේක්ෂා කරයි. එමෙන්ම, එම සම්ප්‍රදාය බිහිවීම හා සංවර්ධනය සඳහා බලපාන ලද ආගමික, දාර්ශනික හා සමාජීය හේතු සාධක කවරේදැයි හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මූලික පර්යේෂණ ගැටලුව වේ. යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය පිළිබඳ ගැඹුරු හා විධිමත් අවබෝධයක් ගොඩනැගීම සඳහා මෙම පර්යේෂණය වැදගත් ශාස්ත්‍රීය දායකත්වයක් සපයනු ඇත.

1 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
karapikkadasobitha@gmail.com

2 ව්‍යවහාරික බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.
msangananda123@gmail.com

3 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
dhammasirihimikottawa@gmail.com

**පර්යේෂණ අරමුණු**

**මූලික අරමුණ**

යෝගාචාර විඥානවාද මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ඓතිහාසික ආරම්භය, විකාශය සහ එහි දාර්ශනික සංවර්ධනය මූලාශ්‍රය පදනම්ව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම.

**උප අරමුණු**

- යෝගාචාර විඥානවාද මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ආරම්භය හා විකාශය සම්බන්ධ මූලාශ්‍රයගත කරුණු විශ්ලේෂණය කිරීම
- එම සම්ප්‍රදාය බිහිවීම හා සංවර්ධනය සඳහා බලපෑ ආගමික, දාර්ශනික, සමාජයීය හා සංස්කෘතික සාධක හඳුනාගැනීම
- යෝගාචාර විඥානවාදයේ දාර්ශනික සංවර්ධනය සිදු වූ ආකාරය විමර්ශනය කිරීම
- එහි දාර්ශනික චින්තනය ගොඩනැගීමට බලපෑ මූලික සංකල්ප හා මූලබීජ හඳුනාගැනීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම් වූවකි. එහි දී ‘පුස්තකාල ග්‍රන්ථ පර්යේෂණ ක්‍රමවේදය’ මූලිකව මෙම පර්යේෂණය සිදුකරන බැවින් ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය, අන්තර්ජාල භාවිතාව හා මානව සම්පත් භාවිතාව මඟින් අධ්‍යයන කොට, ඒවායේ දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, විග්‍රහ කිරීම මඟින් පර්යේෂණයේ නිගමනය කරා යොමු වීම මෙහි පර්යේෂණ ක්‍රමවේදයයි.

**පර්යේෂණ ප්‍රතිඵල**

- යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය එකවර ස්වාධීන ආරම්භයක් ලෙස නොව, මහායාන බෞද්ධ චින්තනය තුළ ක්‍රමිකව විකාශනය වූ දාර්ශනික සම්ප්‍රදායයක් බව අනාවරණය වීම
- එහි ඓතිහාසික ආරම්භය සම්බන්ධයෙන් මූලාශ්‍රය හා විද්වත් මතවාද තුළ ඒකමතික අදහසක් නොපැවතීම
- යෝගාචාර දර්ශනයේ සංවර්ධනය සඳහා නිකායාන්තරික දාර්ශනික මතවාද ප්‍රධාන වශයෙන් බලපා ඇති බව හඳුනාගැනීමට හැකිවීම

**සාකච්ඡාව හා සමාලෝචනය**

ජීවය, විශ්වය, බෝධිපාක්ෂික ධර්ම, කාම රූප අරූප යන ත්‍රෛධාතුකය ආදී සියල්ල විඥානය හෙවත් සිත තුළ ම නිර්මාණය වූ, සිත ම පදනම් කොට ගත්තා වූ

විඥප්තිමාත්‍රයක් බව දක්වන්නහු යෝගාචාර විඥානවාදීන් ලෙස පිළිගැනේ. ඔවුන්ගේ ඉගැන්වීම්වල මූල බීජය වී ඇත්තේ විඥානය යි. විඥානය හැර අන් කිසිවක් සත්‍ය වශයෙන් නොපවත්නා බව ද, මුළු විශ්වයම බුද්ධිමය බව ද ඔවුහු දක්වති. 'සර්වං බුද්ධිමයං ජගත්' එසේම විඥානය බාහිර විෂයයන් කෙරෙහි රඳා නොපවතින බවත්, එය ස්වයං උපස්ථිතියෙන් යුක්ත බවත්, යෝගාචාර මතය යි. එම නිසා යෝගාචාර දර්ශනය 'නිරාලම්බනවාදය' ලෙස ද හැඳින්වේ.

'යෝගාචාර' යනුවෙන් දැක්වෙන්නේ මෙම සම්ප්‍රදායෙහි ප්‍රායෝගික පැතිකඩ යි. සත්‍යාවබෝධය පිණිස යෝගයත්, ආචාරයත් එක සේ අවශ්‍ය බව මෙයින් අදහස් වෙයි. මෙහි 'යෝගය' නම් යෝනිසෝමනසිකාරය යි. එනම් සිහි නුවණින් යෙදී සියුම් ලෙස ගැඹුරට කල්පනා කිරීම යි. සත්‍යාසත්‍යතාව මෙනෙහි කිරීම යි. තර්ක බුද්ධිය යොදමින් යම් කරුණක් පිළිබඳව විමති උපදවා විමර්ශනය කිරීම යි. 'ආචාරය' යනු පරතෝඝෝෂය යි. එනම් ගුරුන්ගෙන් අසා දැන ගැනීම යි. එසේ ගුරුන්ගෙන් අසා දැනගත් යහපත් වූ උපදෙස් නොවෙනස්ව එලෙස ම ආරක්‍ෂා කොටගෙන ක්‍රියා කිරීම යි. මෙසේ විමංසන බුද්ධිය හෙවත් 'යෝගයත්' ගුරු උපදේශය හෙවත් 'ආචාරයත්' පිළිගත්තහු යෝගාචාරීහු නම් වෙති.

**යෝගාචාර විඥානවාද සම්ප්‍රදායේ ඓතිහාසික ආරම්භය**

බොහෝ ඓතිහාසික මූලාශ්‍රය අනුව, යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායෙහි ආරම්භය සිදු වී ඇත්තේ ක්‍රි.ව. 04 වන සියවසේ දී පමණ ය. ආචාර්ය අසංග පාදයන්ගේ දොළොස් වසරක යෝගාභ්‍යාසානුභූතියෙහි ප්‍රතිඵලයක් වූ විඥානවාදය, ඔහුගේ සහෝදරයෙකු වූ ආචාර්ය වසුබන්ධුපාදයන් අතින් පෝෂණය වී ඇත. නමුත් ඇතැම් මූලාශ්‍රය තුළ දැක්වෙන සාධක අනුව මෙහි ආදි කතුවරයා ලෙස සළකනු ලබන්නේ 'ආචාර්ය මෛත්‍රිනාථ' නම් මහතෙර නමකි. උන්වහන්සේ ජීවත් වූ සමය පිළිබඳ ඍජු සඳහනක් හමුනොවුව ද, 'කිමුරා' ආදී පඬිවරු සඳහන් කරනු ලබන්නේ ක්‍රි.ව. 270 - 350 අතර කාලයේ මෙම මෛත්‍රිනාථයෝ ජීවත් වූ බවයි. මෙම සම්ප්‍රදායෙහි සංවර්ධනය උදෙසා මූලික වූ ආචාර්ය අසංග පාදයෝ ද මෛත්‍රිනාථයන් හමුවේ විඥානවාදී දර්ශනය උගත් බව ඇතැම් මූලාශ්‍රය තුළ දැක්වේ. යෝගාචාර සම්ප්‍රදායේ පෝෂණය විෂයෙහි ආචාර්ය මෛත්‍රිනාථයන් අතින් රචනා වූ ග්‍රන්ථ කිහිපයක් හමුවේ. එනම්, අභිසමයාලංකාර, මහායාන සූත්‍රාලංකාර, රත්නගෝත්‍ර විභංග, ධර්ම ධර්මතා විභංග, මධ්‍යාන්ත විභංග යන කෘතීන් ය.

ආචාර්ය මෛත්‍රිනාථයන් විසින් ආරම්භ කරන ලද මෙම සම්ප්‍රදාය, දාර්ශනික වශයෙන් සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම සිදුවූයේ ආචාර්ය අසංග හා වසුබන්ධු යන දෙසොහොයුරන් අතිනි. ඔවුහු මෙම සම්ප්‍රදාය විෂයෙහි තාර්කික පදනමක් එකතු කොට බෞද්ධ විඥානවාදයක් දක්වා පෝෂණය කළහ. මෙම දෙසොහොයුරෝ ක්‍රි.ව. 04 වන සියවසේ දී පමණ භාරතයේ 'පෙෂවෝර්' නගරයෙහි (වර්තමාන පකිස්ථානය) සමුද්‍රගුප්ත රාජ්‍ය අවදියේ දී, බ්‍රාහ්මණ කුලයක ජන්ම ලාභය ලබා ඇති බව දැක්වේ (Stcherbatsky, 1996: 11-12). මෙයින් බාල සොහොයුරු වූ වසුබන්ධු පාදයෝ මූලිකව සර්වාස්තිවාදී සම්ප්‍රදාය නියෝජනය කළ භික්‍ෂුවක් වූ අතර 'අභිධර්මකෝෂ' ආදී සර්වාස්තිවාදී මූල ග්‍රන්ථ කිහිපයක් උන්වහන්සේ අතින් රචනා විය. නමුත් වැඩිමහළු

සොහොයුරු වූ ආචාර්ය අසංග පාදයෝ නියෝජනය කළේ මහායාන සම්ප්‍රදායට අයත් මෙම යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය යි. පසුකාලීනව මෙම සම්ප්‍රදායෙහි වූ ඉගැන්වීම් තම බාල සොහොයුරා වෙත ශ්‍රවණය කිරීමට සැලැස් වූ ආචාර්ය අසංග පාදයෝ, වසුබන්ධු පාදයන් ද මෙම ඉගැන්වීම විෂයෙහි පහදා ගත්හ. අනතුරුව ඔවුන් අතින් රචනා වූ මූල ග්‍රන්ථයෝ මෙම සම්ප්‍රදායෙහි දාර්ශනික සංවර්ධනය විෂයෙහි පෘථුල වූ දායකත්වයක් සපයා ඇත.

මේ අතර ආචාර්ය අසංග පාදයන් අතින් රචනා වූ ප්‍රමුඛ ග්‍රන්ථයෝ දහතුනක් දක්නට ඇත. එනම්, යෝගාචාර ධර්ම සංග්‍රහ, අභිධර්ම සමුච්චය, අභිසමයාලංකාරතත්ත්ව විනිශ්චය, ප්‍රඥාපාරමිතාතත්ත්ව විනිශ්චය, උත්තරතන්ත්‍ර ටීකාව, සන්ධිනිර්මෝචන සූත්‍රටීකා, මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍ර, ප්‍රකරණධිවාවා ශාස්ත්‍ර කාරිකා, සූත්‍රාලංකාර ටීකා, මහායාන අභිධර්ම සංගිති ශාස්ත්‍ර, ෂඩ්ද්වාරොපදීෂ ධ්‍යාන ව්‍යවහාර, මධ්‍යත්තානුගම ශාස්ත්‍ර කාරිකා, වජ්‍රඡේදිකා ප්‍රඥාපාරමිතා සූත්‍ර කාරිකා (මහින්ද සංඝරක්ඛිත හිමි, 2009: 26). එසේම ආචාර්ය වසුබන්ධු පාදයන් විසින් ද රචනා කරන ලද්දා වූ මූල ග්‍රන්ථයෝ දාහතරක් පමණ සොයාගත හැක. අභිධර්මකෝෂය, අභිධර්මකෝෂ භාෂ්‍යය, පරමාර්ථ සප්තිනි, තර්ක ශාස්ත්‍ර, සද්ධර්මපුණ්ඩරීක ටීකා, වජ්‍රච්ඡේදිකා සූත්‍ර ශාස්ත්‍ර, මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍ර ව්‍යාඛ්‍යා, දශභූමික ශාස්ත්‍ර, බෝධිචිත්තෝත්පාද ශාස්ත්‍ර, මධ්‍යාන්ත විභාග ශාස්ත්‍ර, ප්‍රතීත්‍ය සමුප්පාද සූත්‍ර ටීකා, කර්ම සිද්ධි ප්‍රකරණ, මහායාන සූත්‍රාලංකාර ටීකා, විඥප්තිමාත්‍රතාසිද්ධි (විංශතිකා, ත්‍රිංශතිකා) (එම, 54-56).

මෙම දෙසොහොයුරන්ගෙන් අනතුරුව යෝගාචාර විඥානවාද සම්ප්‍රදාය විෂයෙහි, ආචාර්ය වසුබන්ධුපාදයන්ගේ ශිෂ්‍ය වූ ස්ථිරමති නම් ආචාර්යවරයෙකු විසින් වසුබන්ධුපාදයන්ගේ යෝගාචාර විඥප්තිමාත්‍රතාසිද්ධිවාද ත්‍රිංශතිකාවට භාෂ්‍යයක් රචනා කොට තිබේ. එසේම පසුකාලීනව ක්‍රි.ව. 345 - 425 අතර ජීවත් වූ ආචාර්ය දින්නාග හිමියන් යෝගාචාර විඥානවාදී සම්ප්‍රදායෙහි තාර්කික පදනම ඉහළ ස්ථරයකට පත්කළ දාර්ශනිකයෙකු ලෙස සම්භාවනාවට පාත්‍ර වී ඇත. උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවයෙහි ආලෝකය ප්‍රමාණ සමුච්චය, ප්‍රමාණසමුච්චය වෘත්ති න්‍යාය ප්‍රවේශ, ප්‍රමාණ ශාස්ත්‍ර න්‍යාය ප්‍රවේශ, ආලම්භන පරීක්ෂා වෘත්ති (එම, 84-85) යන මූලාශ්‍රය මඟින් ප්‍රකට වේ. ක්‍රි.ව. 500 දී ජීවත් වූ දින්නාග හිමියන්ගේ ශිෂ්‍ය වූ ශංකර ස්වාමි නම් යෝගාචාර ආචාර්යවරයෙක් පිළිබඳව ද, ක්‍රි.ව. 600 පමණ ජීවත් වූ ධර්මපාල නම් යෝගාචාර ආචාර්යවරයෙකු පිළිබඳව ද ඓතිහාසික මූලාශ්‍රය තුළ දැක්වේ. මේ අතර, ආචාර්ය ධර්මපාල හිමියන් විසින්, ආලම්භන ප්‍රත්‍ය ධ්‍යාන ශාස්ත්‍ර ව්‍යාඛ්‍යාව, විඥප්තිමාත්‍රතා සිද්ධි ව්‍යාඛ්‍යාව, සතසහශ්‍ර ව්‍යාඛ්‍යාව (එම, 117) යන ග්‍රන්ථ රචනා කොට තිබේ. එසේම උන්වහන්සේගෙන් පසුව ආචාර්ය ශාලිභද්‍ර (ක්‍රි.ව. 635) ආචාර්ය දේවේන්ද්‍රබෝධි (ක්‍රි.ව. 650) ආචාර්ය ශාන්තරක්ෂිත (ක්‍රි.ව. 749) ආචාර්ය කමලශීල (ක්‍රි.ව. 750) ආචාර්ය කල්‍යාණරක්ෂිත (ක්‍රි.ව. 749) ආචාර්ය ධර්මෝත්තර (ක්‍රි.ව. 889) යන ආචාර්යවරු ද යෝගාචාර විඥානවාදය විෂයෙහි තම අදහස් ඉදිරිපත් කරමින් මෙම දර්ශනය තවදුරටත් පෝෂණය කොට ඇත.

**යෝගාචාර විඥානවාද සම්ප්‍රදායේ දාර්ශනික සංවර්ධනය**

නිකායාන්තර බුදුසමයෙහි දාර්ශනික චින්තනයන් විෂයෙහි පදනම් වූ ‘ධම්ම’ විග්‍රහය තුළ, ථෙරවාදී සම්ප්‍රදායෙහි දැක්වෙන්නා වූ පුද්ගල නෛරාත්මයත්, ධර්ම අස්තිත්වයත් පදනම් වූ ධර්මවාදයත්, ඒ තුළ ඉස්මතු වන්නා වූ *‘බාහ්‍යාර්ථප්‍රත්‍යක්‍ෂවාදය’* නම් වූ දාර්ශනික චින්තනය ද, සර්වාස්තිවාදී සම්ප්‍රදාය දක්වන්නා වූ සර්වකාලීන ධර්ම අස්තිත්වය පදනම් වූ ධර්මවාදී චින්තනය ද, සෞත්‍රාන්තිකයන්ගේ බාහ්‍යාර්ථ අනුමේයවාදය මූලික වූ ධර්ම ක්‍ෂණ භංගුරත්වවාදී ආකල්ප ද, සර්වකාලීන පුද්ගල අස්තිත්වය මූලික වු පුද්ගලවාදය ද, ප්‍රතික්‍ෂේප කරමින් නිර්මාණය වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස මධ්‍යමක ශූන්‍යතාවාදය දැක්වේ. මෙහි දී සියලු පුද්ගලවාදි ආකල්ප මෙන්ම ධර්මයන්ගේ ද අස්තිත්වය ප්‍රතික්‍ෂේප වන අතර, ඒ තුළින් ඔවුහු සර්ව ශූන්‍යතාවක් ඉදිරිපත් කළහ. එසේ වුව ද මෙම මධ්‍යමක දර්ශනය තුළ ද වන්නා වූ දෝෂයක් වේ. එනම් සර්ව ශූන්‍යත්වයක් ඉදිරිපත් වූ කල, එම ශූන්‍යත්වය පිළිබඳ විඥෙය ලැබීම හෙවත් අවබෝධය කෙසේ සිදුවේ ද, යන ගැටලුවයි. මෙම ඌණතාවය මගහරිනු පිණිස ඇති වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස යෝගාචාර විඥානවාදය දැක්වේ. ඒ තුළ සර්ව ශූන්‍යත්වය ප්‍රතික්‍ෂේපවන අතර, ඒ සඳහා බාහ්‍යාර්ථ ශූන්‍යත්වයක් ඉදිරිපත් වේ. ඒ තුළින් ඔවුන් පෙන්වා දෙනුයේ ‘විඥාන’, ‘විඥෙය’ යන පදාර්ථ තුළ විඥානයෙහි පැවැත්මත් ‘විඥෙය’ හි නිෂේධනයත් ය. මෙම පදනම මත යෝගාචාර දර්ශනයේ මූලික සිද්ධාන්තයක් නිර්මාණය වේ. එනම් විඥප්තිමාත්‍රතාව හෙවත් චිත්තමාත්‍රතාවයි. ඒ තුළ ආනුභවික ලෝකය විඥානයෙන් පමණක් නිර්මාණය වූවක් බව ඔවුහු දූක්වූහ.

**ප්‍රමුඛ පද** - මහායානය, යෝගාචාරය, ධර්ම, ශූන්‍යතාව, විඥප්තිමාත්‍රතාව

## ආශ්‍රිත ග්‍රන්ථ

*සං.නි. සගාථා වග්ග*, භික්ඛුණී සංයුත්ත, වජිරා සුත්ත.

නානායක්කාර, එස්. (2003). *මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්.* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මහින්ද සඞ්ඝරක්ඛිත හිමි, කේ. (2009). *බෞද්ධ මහාදාර්ශනිකයෝ 2*, කොළඹඃ සීමාසහිත ගොඩගේ සහ සහෝදරයෝ.

*මූලමාධ්‍යමකකාරිකා*, (සංස්). එම්. සාසනරතන හිමි.

මේධානන්ද හිමි, ඩී. (1998). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්*, වරකාපොලඃ ආරිය ප්‍රකාශන.

Stcherbatsky, F. Th. (1996). *Buddhist Logic Voliume I,* Musshiram Manoharlal publishers pvt. Ltd.